# ජනාධිපතිවරණය නිරීක්ෂණයට

# ආසියානු මැතිවරණ ජාලය ලංකාවට පැමිණෙයි

ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම ක්‍රියාත්මක කරවීමේ අරමුණින් එළඹෙන ජනාධිපතිවරණය සඳහා රටවල් 16ක් නියෝජනය කරන නිදහස් මැතිවරණයක් සඳහා වූ ආසියානු මැතිවරණ ජාලයේ මැතිවරණ නිරීක්ෂක කණ්ඩායමක් පෙරේදා (23) දිවයිනට පැමිණියහ.

පිලිපීනයේ දමිසෝ මැග්බුඅල් මහතා ප්‍රමුඛ මෙම දූත පිරිසට නායකත්වය දරන්නේ ලොව වටා සිටින ප්‍රවීණ මැතිවරණ නිරීක්ෂකයෝ ඇතුළත් වෙති.

02 පිටුව

## ජනාධිපතිවරණය නිරීක්ෂණයට....

මැතිවරණ විශ්ලේෂකයින් 02ක් ඇතුළුව ප්‍රධානීන් 04ක්, දිගු කාලීන නිරීක්ෂකයින් 09ක් සහ කෙටි කාලීන නිරීක්ෂකයින් 28කගේ සහභාගිත්වයෙන් මැතිවරණ බල ප්‍රදේශ සියල්ල ආවරණය වන පරිදි එම කටයුතු ව්‍යාප්ත වී තිබේ.

ප්‍රජාතාන්ත්‍රික මූලධර්මයන් සහ යහපත් මැතිවරණ ක්‍රියාවලියක් තහවුරු කරනු පිණිස මැතිවරණ පාර්ශ්වකරුවන් සමඟ එක්ව කටයුතු කිරීමට ආසියානු මැතිවරණ ජාලය අපේක්ෂා කරයි. මැතිවරණ නිරීක්ෂණ බල ප්‍රදේශවලට අනුයුක්ත කිරීමට පෙර ඔවුන් සඳහා අවශ්‍ය මූලික දැනුවත් කිරීම කොළඹදී ලබා දීමට නියමිතය.

ජනාධිපතිවරණය සඳහා සිය ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සියල්ල සූදානම් බව නිදහස් මැතිවරණයක් සඳහා වන ආසියානු ජාලය නිකුත් කළ නිවේදනයේ වැඩිදුරටත් සඳහන් වේ.